# පොලිස් සැපයුම් කොට්ඨාශය
## பொலிஸ் விநியோகப் பிரிவு
## POLICE SUPPLIES DIVISION


අධ්‍යක්ෂ- සැපයුම්
**Director/Supplies**
Telephone No : 011-2399141
Fax : 011-2320729
Extension : 3015
E-Mail : dir.supplies@police.lk

සහකාර පොලිස් අධිකාරි- සැපයුම්
**ASP/Supplies**
Tele/Fax : 011-2324915
Extension : 3110

ස්ථානාධිපති- සැපයුම්
**OIC/Supplies**
Tele/Fax : 011-2543012
Extension : 3111

පොලිස් මූලස්ථානය, දෙවන මහල, කොළඹ 01, ශ්‍රී ලංකා.
பொலிஸ் தலைமை அலுவலகம், 2 டாம் மாடி கொழும்பு 01, இலங்கை.
POLICE HEADQUARTERS, 2nd FLOOR, COLOMBO 01, SRI LANKA.

මගේ අංකය
My No }

ඔබේ අංකය
Your No }

ගණකාධිකාරි- සැපයුම්
**Accountant/Supplies**
Tele/Fax : 011-2324729
Extension : 3113

ප්‍රධාන කළමණාකරණ සහකාර
**Chief Management Asst:**
Extension : 3118

General No: 011-2421111


2023.03.22

තරිඳු ජයවර්ධන මහතා,
සමාජය හා සාමයික කේන්ද්‍රය,
නො. 281,
ඩීන්ස් පාර,
කොළඹ 10.

**<u>තොරතුරු දැන ගැනීමේ පනතේ 25(3) යටතේ 2022 වර්ෂයේ ශ්‍රී ලංකා පොලිසිය වෙත කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා ආරම්භ කර ඇති ප්‍රසම්පාදනයන් සම්බන්ධව ඉල්ලා ඇති තොරතුරු ලබාදීම</u>**

ඔබ විසින් 2023.03.14 දින පොලිස්පති තුමා වෙත යොමුකරන ලද විද්‍යුත් තැපැල් පණිවිඩයට අදාල තොරතුරු ලබාදීමට කටයුතු කරන ලෙස මා හට උපදෙස් ලබාදී ඇත. ඒ අනුව පහත වාර්තාව ඉදිරිපත් කරමි.

තොරතුරු දැන ගැනීමේ පනතේ 25(3) යටතේ තොරතුරු ඉල්ලා ඇතත්, ඔබ ඉදිරිපත් කර ඇති කරුණු වලට අනුව එම පනතේ 25(2) ට අදාල වන බව නිරීක්ෂණය වේ.

01. පොලිස්පති තුමා විසින් 2022 ජූලි 07 දින නීතිය හා සාමය අමාත්‍යාංශය වෙත යොමුකල ලිපියේ පිටපත "ඇමුණුම 01" ලෙස යාකර ඉදිරිපත් කරමි.

02. පොලිස්පති තුමා හා නීතිය හා සාමය අමාත්‍යාංශය අතර හුවමාරු වූ ලිපි මෙම ලිපියේ අනු අංක 01, 03 යටතේ සහ මා විසින් 2023.03.18 දින ඔබ වෙත යොමු කරන ලද වාර්තාවට ඇතුලත්ව ඇත.

03. 2023.02.20 දින පොලිස්පති තුමා විසින් නීතිය හා සාමය අමාත්‍යාංශය වෙත යොමුකල ලිපියේ පිටපත "ඇමුණුම 02" ලෙස යාකර ඉදිරිපත් කරමි.

04. 2022 ජූලි මාසයේ දී කැබිනට් අනුමැතිය ලැබීමෙන් පසු ඒස් ඉන්ටර්නැෂනල් ආයතනය වෙත යොමුකල ලිපිවල පිටපත් මා විසින් 2023.03.18 දින ඔබ වෙත යොමුකරන ලද වාර්තාවට ඇතුලත්ව ඇත.

05. මෙතෙක් ලංසු ප්‍රධානයක් සිදුකර නොමැත.

06. මා විසින් 2023.03.21 දින ඔබ වෙත යොමුකරන ලද වාර්තාවට ඇතුලත්ව ඇත.

07. ඒස් ඉන්ටර්නැෂනල් ආයතනයට සාම්පල් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතත්, සාම්පල් ඉදිරිපත් කර නොමැති බැවින්, සාම්පල් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කටයුතු සිදුකර නොමැත.

08. මෙතෙක් ලංසු ප්‍රධානයක් සිදුකර නොමැති බැවින් ගිවිසුම් අත්සන් කර නොමැත.

අධ්‍යක්ෂ/ සැපයුම් 22/3/23

අධ්‍යක්ෂ - සැපයුම්
සැපයුම් කොට්ඨාශය
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

පිටපත - ගොනුවට

C-14:\Users\Desktop\සාමයික කේන්ද්‍රය\Tharindu- 2023.03.22.docx

පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEADQUARTERS, COLOMBO, SRI LANKA

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 517

දුරකථනය / தொலைபேசி / Telephone +94 (0) 11 24 21 750, +94 (0) 11 24 21 111 - 9

website: www.police.lk

ෆැක්ස් / தொலைநகல் / Fax +94(0) 11 24 46 174, +94(0) 11 24 40 440

ඊ-මේල් / மின் அஞ்சல் / E-mail igp@police.lk, telligp@police.lk

මගේ අංකය / எனது இல. / My No. IGP/PA/M/out/1349/2022

ඔබේ අංකය / உமது இல. / Your No

දිනය / திகதி / Date 2022.07.07.

ලේකම්,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය.

**<u>ශ්‍රී ලංකා පොලිසිය සතුව කඳුළු වායු උණ්ඩ 1500ක් පමණක් ආරක්ෂිත තොගයේ ඇති පසුබිම තුල පවතින හදිසි අවශ්‍යතාව සඳහා සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කඳුළු වායු උණ්ඩ සහ කඳුළු වායු බෝම්බ 10000 බැගින් මිල දී ගැනීමට සහ ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.</u>**

දිවයින තුල වර්තමානයේ පවතින ආර්ථික, දේශපාලනික සහ සමාජීය අර්බුදකාරි වාතාවරණය යටතේ මහජනයා විසින් අන් කාල පරිච්ඡේදවලට සාපේක්ෂව දීප ව්‍යාප්තව ඉහල අගයකින් උද්ඝෝෂණ, පෙළපාලි ආදී විරෝධතා ව්‍යාපාර පැවැත්වීම සිදු කෙරේ.

02. මෙම විරෝධතා ව්‍යාපාර ඇතැම් අවස්ථාවල ප්‍රචණ්ඩකාරි තත්වයට පත්වන අතර එවැනි අවස්ථාවල ඒවා මැඩ පවත්වා නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ වගකීම මූලිකවම ශ්‍රී ලංකා පොලිසිය වෙත පැවරී ඇත.

03. ප්‍රචණ්ඩකාරි තත්වයට පත්වන විවිධ නීති විරෝධී විරෝධතා ව්‍යාපාර මැඩ පැවැත්වීම සඳහා විසිර යාමට කරනු ලබන නියෝග පිළි නොගන ක්‍රියා කිරීමේ දී අදාළ කලහකාරි පිරිස් විසිරුවා හැරීමට පොලිසියට අවශ්‍ය බලය පාවිච්චි කිරීමට සිදු වේ. එසේ බලය පාවිච්චි කිරීමේ දී මහජනයාට සිදුවන හානි සහ පීඩා අවම කිරීම සඳහා කඳුළු ගෑස් භාවිතය මූලිකතම ක්‍රමවේදය වන මෙය ගෝලීය වශයෙන් ද පිළිගෙන ක්‍රියාත්මක කරනු ලබන මූලික ක්‍රමවේදය වේ.

04. ඒ අනුව නීති විරෝධී විරෝධතා ව්‍යාපාර මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකා පොලිසියේ අවශ්‍යතාවට ප්‍රමාණවත් වන පරිදි කඳුළු වායු උණ්ඩ (CS Shells) සහ කඳුළු වායු බෝම්බ (CS Grenade) සංචිත පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. අවසන් වරට ශ්‍රී ලංකා පොලිසියට 2019 වසරේ කඳුළු වායු උන්ඩ 15000ක් ද, 2020 වසරේ කඳුළු වායු බෝම්බ 5000ක් ද මිල දී ගෙන ඇති අතර පසුගිය කාල පරිච්ඡේදය තුල නීති විරෝධී විරෝධතා ව්‍යාපාර ඉහළ අගයකින් පැවැති බැවින් ඒවා මැඩ පැවැත්වීම සඳහා භාවිතා කිරිම මත මෙ වන විට ප්‍රාදේශීය සහ ක්‍රියාකාරි කොට්ඨාශ වලට මෙන්ම ආරම්භ කරන ලද නව පොලිස් ස්ථාන 111 ක් සඳහාද නිකුත් කරන ලද අතර, කල් ඉකුත්වීමට ආසන්නව ඇති කඳුළු වායු උණ්ඩ සහ කඳුළු වායු බෝම්බ අතහැර ගත් කල පොලිසිය සතු කඳුළු වායු උණ්ඩ සහ කඳුළු වායු බෝම්බ අවසන් වීමට ආසන්නව පවතී. ආරක්ෂිත තොගය වශයෙන් පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ මධ්‍යම අවි ගබඩාවේ කඳුළු වායු උණ්ඩ 1500ක් පමණක් ඇති අතර කඳුළු වායු බෝම්බ ආරක්ෂිත තොගයේ නැත.

05. දිවයින තුල දැනට උද්ගතව ඇති ආර්ථික ගැටළු සහ ඒ මත පදනම්ව ගොඩනැගෙන දේශපාලනික හා සමාජීය අර්බුද ඉදිරි වසර කිහිපයක් වැනි දිගු කාල පරිච්ඡේදයක් තුල ද පවතිනු ඇති බවට එළඹ ඇති කරුණු අනුව සහ ක්ෂේත්‍රයේ විද්වතුන් ගේ පුරෝකථන අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව අදාළ විරෝධතා ව්‍යාපාර එම දිගු කාල පරිච්ඡේදය තුල දිවයින පුරා ක්‍රියාත්මක විය හැකි බවට ගම්‍ය වන අතර අර්බුදයේ තීව්‍රතාව මත ඇතැම් විට ඉදිරියේ දී මහජනයා අදාළ උද්ඝෝෂණ දැනට වඩා ප්‍රබලතාවකින් යුතුව සිදු කිරීම සඳහා පෙළඹීමට ඉඩ ප්‍රශ්තාව පවතින බවට වූ කරුණ ද බැහැර කල නොහැක. මෙම පසුබිම තුල ඉදිරියේ දී නීති විරෝධී තත්වයට පත්වන විරෝධතා ව්‍යාපාර විසුරුවා හැරීම සඳහා අවශ්‍යතාවට ප්‍රමාණවත් ලෙස කඳුළු වායු උන්ඩ සහ කඳුළු වායු බෝම්බ සපයා ගැනීමට නොහැකි වූවහොත් එකී නීති විරෝධී විරෝධතා ව්‍යාපාර විසුරුවා හැරීම සඳහා විකල්ප ක්‍රමවේද අනුගමනය කිරීමට සිදුවන අතර පවතින විධිවිධාන අනුව ඒ තුලින් නෛතික ගැටළු ඇති

පොලිස්පතිගේ උපදේශ අනුව ... ගැන ඇ...
සත්‍ය පිටපත...
............................
ප්‍රධානියෙකි/සැකසු

වීමට මෙන්ම රජය අපහසුතාවකට පත්වීමට ද හේතු සාධක වනු ඇත. ඒ අනුව ශ්‍රී ලංකා පොලිසියේ අවශ්‍යතාව සඳහා ඉතා කඩිනමින් කෙටි කාලයක් තුල කඳුළු වායු උණ්ඩ (CS Shells) – 10000 ක්ද, කඳුළු වායු බෝම්බ (CS Grenade) - 10000 මිලදී ගැනීම අත්‍යවශ්‍ය වේ. 2022 වර්ෂයට ශ්‍රී ලංකා පොලිසිය සඳහා මෙම අයිතම මිලදී ගැනීමට ප්‍රමාණවත් වෙන්කර නැති බැවින් අවශ්‍ය ප්‍රතිපාදන අතිරේකව වෙන්කර ගත යුතුව ඇත.

06. මෙම අයිතම ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) යටතේ මෙම මිල දී ගැනීම සිදු කිරීමට ක්‍රියා කල හොත් ඒ සඳහා පුවත්පත් දැන්වීම පල කිරීමට සිදුවන අතර ඒ තුලින් අදාළ තොරතුරු මහජනයා වෙත සංදේශනය වී වර්තමානයේ රටේ පවතින ආර්ථික අර්බුදය තුල මෙවැනි කාර්යයකට දරණ පිරිවැය සම්බන්ධයෙන් සමාජයේ කතිකාවතක් ගොඩනැගී රජය ද්වේෂ දර්ශනයට ලක්ව අපහසුතාවකට පත්වීමට ඉඩ ප්‍රස්තාව පවතී. එමෙන්ම මෙම අයිතම ඉතා කඩිනමින් කෙටි කාලයක් තුල මිල දී ගැනීමේ අවශ්‍යතාව පවතින පසුබිම යටතේ ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) ඔස්සේ මිල දී ගැනීමට ක්‍රියා කලහොත් එම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා අත්හල නොහැකි දීර්ඝ කාලයක් ගත වේ. ඒ අනුව මෙම මිල දී ගැනීම, ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) වෙනුවට සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ තනි සැපයුම් මූලාශ්‍රයකින් සිදු කිරීම වඩාත් ප්‍රායෝගික බව නිරීක්ෂණය වේ.

07. ශ්‍රී ලංකා පොලිසිය වෙත අවසන් වරට , 2019 වර්ෂයේ දී LA/S1/FFHQ/02/2019 ප්‍රසම්පාදන ගොනුව යටතේ ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) අනුව ලංසු ප්‍රධානය කර ACE International, AG/3/1, Sri Sahgharaja Mawatha, Colombo – 10 ආයතනය මගින් කඳුළු වායු උණ්ඩ (CS Shells) 15000ක් ද, 2020 වසරේදී LA/S1/FFHQ/13/2019 ගොනුව යටතේ කඳුළු වායු බෝම්බ 5000ක් ද, මිල දී ගෙන ඇති අතර එම ආයතනයේ මව් සමාගම වන M/S. C-Rich Co. Ltd, B-1801, Woolim Lion's Valley 5, Galmachiro 302, Jungwon-gu Seongnam – Si Gyeonggi-do, Korea විසින් කඳුළු වායු උණ්ඩයක් ඇමරිකානු ඩොලර් 9.77ක වද, කඳුළු වායු බෝම්බයක් ඇමරිකානු ඩොලර් 41 ක වද (නැවට පටවන තෙක් මිල - FOB) මිල යොදා ඇත. අදාළ ආයතනය විසින් එම මිල ගණන් යටතේම කඳුළු වායු උණ්ඩ (CS Shells) සහ කඳුළු වායු බෝම්බ සැපයිය හැකි බව දන්වා ඇත. ඒ අනුව මෙම අයිතම ACE International, AG/3/1, Sri Sangharaja Mawatha, Colombo – 10 ආයතනෙයෙන් සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ මිල දී ගැනීම සුදුසු බව නිරීක්ෂණය වේ.

08. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය අනුව මෙම අයිතම මිල දී ගැනීම සඳහා සුදුසුතම ක්‍රමවේදය ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) වේ. නමුදු ඉහත ඡේද අංක 06හි සඳහන් කරුණු මත මෙම අවස්ථාවේ එම ක්‍රමවේදය යටතේ මිල දී ගැනීමට ක්‍රියා කිරීමෙන් ඇතිවන ගැටළු වලක්වා ගැනීමට සහ අදාළ අයිතම කඩිනමින් සපයා ගැනීමේ අවශ්‍යතාව මත විකල්ප ක්‍රමවේදයක් වශයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 වගන්තිය අනුව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ අදාළ අයිතම මිල දී ගැනීම සුදුසු බවත්, මෙය විශේෂ අවස්ථාවක් වන බැවින් ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත්, නිරීක්ෂණය වේ.

09. ඉහත සමස්ත කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර,

i. සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ACE International, AG/3/1, Sri Sangharaja Mawatha, Colombo – 10 ආයතනය වෙතින්, එක් ඒකකයක් අමරිකානු ඩොලර් 7.99ක් (නැවට පටවන තෙක් ගාස්තුව - FOB) යටතේ කඳුළු වායු උණ්ඩ (CS Shells) – 10000ක් ද, එක් ඒකකයක් ඇමරිකානු ඩොලර් 41ක් (නැවට පටවන තෙක් ගාස්තුව - FOB) යටතේ කඳුළු වායු බෝම්බ (CS Grenade) – 10000ක් ද, නැව් ගාස්තු, රක්ෂණ ගාස්තු, බදු සහ රේගු ගාස්තු ආදි අදාළ ගාස්තු ඇතුලත් කර මිල දී ගැනිමටත්,

ii. උක්ත අයිතම මිල දී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරය වෙතින් වෙන්කර ගැනිමටත්,

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනිම සහ අදාළ අනුමැතියට යටත්ව ඉදිරි ක්‍රියා මාර්ග සඳහා අවතීර්ණවීම සුදුසු බවට නිර්දේශ කර තත් කාර්යය සඳහා කෙටුම්පත් කල අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත ද සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

සී.ඩී.වික්‍රමරත්න,
පොලිස්පති.

සී. ඩී. වික්‍රමරත්න
පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

(323) (321) 788

ඇමුණුම - 02

2023.02.20

ලේකම්,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය

ශ්‍රී ලංකා පොලිසිය වෙත අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කඳුළු වායු උණ්ඩ (CS Shells) 10,000 ක් සහ කඳුළු වායු අත් බෝම්බ (CS Grenades) 5,000 ක් මිලදී ගැනීම ට අදාල ප්‍රසම්පාදනය සම්බන්ධයේ ප්‍රගතිය

ශිර්ෂගත කරුණ සම්බන්ධයෙන් 2022.07.28 දිනැති ඔබගේ අංක NPS/03/PB/GEN/07/15/22 දරණ ලිපිය හා සබැඳේ.

2. 2022 වර්ෂයේ දිවයින තුළ පැවති ආර්ථික, දේශපාලනික හා සමාජීය අර්බුධකාරි වාතාවරණය යටතේ නීති විරොධි මහජන විරෝධතා විසුරුවාහැරිමේ එක් පියවරක් ලෙස භාවිතා කිරිම සඳහා ප්‍රමාණවත් කඳුළු වායු උණ්ඩ හා කඳුළු වායු බෝම්බ ප්‍රමාණවත් සංචිතයක් ශ්‍රී ලංකා පොලිසිය සතුව නොතිබිම මත CS Shells 10000 ක් හා CS Grenade 5000 ක් සෘජු කොන්ත්‍රාත් ක්‍රමවේදය යටතේ ACE International ආයතනය මගින් මිලදි ගැනිමට 2022.07.27 දිනැති අමාත්‍ය මණ්ඩල තිරණ මගින් අනුමැතිය ලබා දි ඇති අතර, ප්‍රසම්පාදනයේ ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කරමි.

3. කඳුළු වායු උණ්ඩ 10,000 ක් සහ කඳුළු වායු බෝම්බ 5,000 ක් මිලදී ගැනීම සෘජු ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ ලංසු පත්‍රිකා සමග ලංසු ආරාධනා ලිපි 2022.09.14 වන දින ACE International ආයතනය වෙත ලබාදී එම ලංසු 2022.09.28 වන දින විවෘත කලමුත් ආයතනය විසින් ඒ සඳහා ඉදිරිපත් නොවිය.

4. ACE International ආයතනය විසින් 2022.09.27 දින ලිපියක් ඉදිරිපත් කරමින් අවම වශයෙන් කඳුළු වායු බෝම්බ 10,000 ක් මිලදී ගතයුතු බවත්, ආදර්ශ ඉදිරිපත් කිරිම සඳහා ඉහල මිලක් වැයවීම හා ප්‍රවාහන ගාස්තු ඉහල යාම මත ආදර්ශ ලබා දීම සිදුකල නොහැකි බවත්, මීට පෙර මෙම අයිතම සපයා ඇති බැවින් භාණ්ඩ සැපයීමෙන් පසු ගුණාත්මකභාවය පරීක්ෂා කල හැකි බව දැනුම් දි ඇත.

5. ඉහත ලිපියට අදාලව කරුණු පැහැදිළි කර ගැනිම සඳහා ACE International ආයතනයේ අධ්‍යක්ෂ වරුණ ගුණවර්ධන මහතා සමග සාකච්ඡාවක් නි.පො.ප - ප්‍රවර්ථන දිසාවගේ ප්‍රධානත්වයෙන් 2022.10.04 වන දින පවත්වා ඇත. එහිදි, අමාත්‍යාංශ අනුමැතිය ලබා ඇති ප්‍රමාණය පමණක් මිලදී ගතයුතු බැවින් අංක LA/S1/FFHQ/05/2022 කඳුළු වායු උණ්ඩ 10,000 ක් සහ LA/S1/FFHQ/06/2022

මුල් පිටපතින් උපුටා ගන්නා ලද
සත්‍ය ඡායා පිටපතකි.

ස්ථානාධිපති/සැපයුම්

යටතේ කඳුළු වායු බෝම්බ 5,000 ක් සඳහා ලංසු ඉදිරිපත් කරන ලෙසට ආයතනයේ අධ්‍යක්ෂ වරුණ ගුණවර්ධන මහතාහට එම සාකච්ඡාවේදී දැනුම් දී ඇත.

6. ඒ අනුව, ACE International ආයතනයේ අධ්‍යක්ෂ වරුණ ගුණවර්ධන මහතා විසින් විදේශ නියෝජිත ආයතනය සමග සාකච්ඡාවක් කර 2022.10.10 වන දින අධ්‍යක්ෂ - සැපයුම් කොට්ඨාසය වෙත ලිපියක් යොමුකරමින්,

    i) තම බලවත් ඉල්ලීම මත කඳුළු වායු උණ්ඩ 10,000 ක් හා කඳුළු වායු බෝම්බ 5000 ක් ලබා දීමට විදේශ නියෝජිත ආයතනය එකඟ වී ඇති බවත්,

    ii) වර්ථමාන වෙළඳපොල තුළ කඳුළු වායු උණ්ඩ සහ කඳුළු වායු බෝම්බ මිල 100% ත් 120%ත් අතර ප්‍රතිශතයකින් ඉහල යාමක් දක්නට ඇති බැවින් මෙම මිලදි ගැනීම ශ්‍රී ලංකා පොලීසියට ඉතා වාසිදායක බවත්,

    iii) දැනට ශ්‍රී ලංකාව තුළ පවතින අර්බුදකාරී තත්වය හේතුවෙන් ටෙලිග්‍රැෆික් ට්‍රාන්ස්ෆර් (Telegraphic Transfer) ක්‍රමවේදය යටතේ ප්‍රසම්පාදනයේ වටිනාකමින් 50% ක ඇණවුම සමග ඉතිරි 50% භාණ්ඩ සැපයීම සමග ගෙවීම් කරන ලෙසටත්,

    iv) එමෙන්ම මෙම මිලදී ගැනීමෙන් මාස 04 කින් පසු තවත් කඳුළු වායු බෝම්බ 5000 ක් තම ආයතනය මගින් මිලදී ගැනීමට කටයුතු කරන ලෙස

    දැනුම් දී ඇත.

7. ඉහත 5-iii අනුව, ශ්‍රී ලංකා පොලිසිය විසින් විදේශිය රටවලින් භාණ්ඩ ආනයනය කිරිමේදි ණයවර ලිපි (LC) විවෘත කර සිදුකිරිම සාමාන්‍ය ක්‍රමවේදය වන බැවින් සහ ටෙලිග්‍රැෆික් ට්‍රාන්ස්ෆර් (Telegraphic Transfer) ක්‍රමවේදය යටතේ මෙතෙක් භාණ්ඩ ආනයනය කර නොමැති බැවින්, මේ සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා 2022.10.18 දිනැතිව රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙතින් කරන ලද ඉල්ලීම රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත 2022.10.26 වන දින යොමු කර ඇත.

8. මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ/ සැපයුම් හා ගණකාධිකාරී/ සැපයුම් විසින් 2022.12.02 වන දින මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මදූෂා ෆොන්සේකා මහත්මිය සමග මුදල් අමාත්‍යාංශයේදී සාකච්ඡාවක් පවත්වා ඇති අතර, එහිදි නිශ්චිත තීරණයක් සඳහා එළඹීමට නොහැකිවී ඇත.

9. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති ලිපියට අදාල පිළිතුරු ලැබීම ප්‍රමාදවීම වීම මත පවතින හදිසි අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන මෙම ප්‍රසම්පාදනයට අදාල ඉදිරි කටයුතු කඩිනමින් සිදු කිරිම සඳහා රේඛිය අමාත්‍යාංශය විසින් පත්කරන ලද සාමාජිකයන්ද ඇතුලත්ව කමිටුව පත් කර ගොනුව ඇගයීම් කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත 2022.12.18 වන දින යොමු කර ඇත.

(286) (...) (320)

10. ඒ අනුව, ජ්‍යෙ.නි.පො.ප අපරාධ හා රථවාහන එල්.කේ.ඩබ්.කේ. සිල්වා මහතාගේ සභාපතීත්වයෙන් යුත් තාක්ෂණික ඇගයීම් කමිටුව 2023.01.19 වන දින පැය 0930 ට රැස්වී ගොනුව ඇගයීමට ලක්කර හදිසි තත්වය මත කැබිනට් අනුමැතිය ලබා දීමත් යන කරුණු පදනම් කරගෙන කඳුළු වායු උණ්ඩ (CS Shells) 10,000 ක් සහ කඳුළු වායු බෝම්බ (CS Grenade) 5000 ක් AG/3/1, Sri Sangaraja Mawatha, Colombo 10 ලිපිනයේ පිහිටි ACE International ආයතනය වෙතින් රු. 144,227,050.00 (වැට් රහිත) මුදලකට මිලදී ගැනීම නිර්දේශ කර ඇත.

11. ACE International ආයතනය විසින් කඳුළු වායු බෝම්බ (CS Grenade) 5000 ක ප්‍රමාණය 10000 දක්වා වැඩිකර දෙන ලෙස කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් 2023.01.25 දින නි.පො.ප/ ප්‍රවර්ථන දිසාවගේ ප්‍රධානත්වයෙන් සැපයුම් ආයතනයේ වරුණ ගුණවර්ධන මහතා ඇතුළු නිලධාරීන් සමග නැවත සාකච්ඡාවක් පැවැත්වූ අතර, අදාල සැපයුම්කාර ආයතනය මේ පිළිබදව විදේශ සැපයුම්කාර ආයතනය සමග සාකච්ඡාකර ඒ පිළිබදව ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන බව දන්වා ඇත. එමෙන්ම, 2022.10.26 භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද ලිපියේ ප්‍රගතිය පරීක්ෂා කරන ලෙස අධ්‍යක්ෂ/ සැපයුම් වෙත උපදෙස් ලබා දී ඇත.

12. ඉහත උපදෙස් පරිදි අධ්‍යක්ෂ/ සැපයුම් හා ගණකාධිකාරී/ සැපයුම් 2023.01.26 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ගොස් සහකාර අධ්‍යක්ෂ නිලූකා මෙනවිය මුණගැසී අදාල ලිපියේ ප්‍රගතිය විමසා ඇත. එහිදී, අදාල ලිපිය 2023 වර්ෂයට ප්‍රතිපාදන පවතිද යන්න පරීක්ෂා කිරීමට අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බව දන්වා ඇති අතර, අයවැය දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ ලක්ෂිකා මහත්මිය මුණගැසී විමසීමේදී ප්‍රතිපාදන පවතින බවට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට ලිපි සකස්කර ඉදිරිපත් කර ඇති බව දැනුම් දී ඇත. ඒ අනුව, අදාල ලිපිය රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාල බැවින් එය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව දැනුම් දී ඇත.

13. ටෙලිග්‍රැෆික් ට්‍රාන්ස්ෆර් (Telegraphic Transfer) ක්‍රමවේදය යටතේ ගෙවීම් කිරීමට අදාල උපදෙස් පතා ඉදිරිපත් කල ලිපියට අදාල පිළිතුරු ලිපියක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් විසින් 2023.02.01 ඉදිරිපත් කරමින් ඒ සදහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.5 හා ප්‍රසම්පාදන අතිරේක 29 හි සදහන් කරුණු පිළිබදව අවධානය යොමුකර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන සහ කොන්ත්‍රාත් ගිවිසුමේ ගිවිසුම් ගත කරුණු අනුව කටයුතු කිරීම සුදුසු බවට උපදෙස් ලබාදී ඇත.

14. ACE International ආයතනය විසින් 2023.01.30 දිනැතිව ලිපියක් ඉදිරිපත් කරමින් මෙම භාණ්ඩ 2019/2020 වර්ෂයේ සැපයුම් කරන ලද මිල ගණන් යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි අදාල භාණ්ඩ සැපයුම් කිරීමට හැක්කේ ඉදිරියට මාස 02 ක කාලයක් තුලදී පමණක් බවට සදහන් කර ඇත.

මුල් පිටපතින් උපුටා ගන්නා ලද
සත්‍ය ජායා පිටපතකි.

ස්ථානාධිපති/සැපයුම්

15. තාක්ෂණික ඇගයීම් කමිටු නිරීක්ෂණ අනුව සැපයීමට නියමිත කඳුළු වායු උණ්ඩ (CS Shells) හා කඳුළු වායු බෝම්බ (CS Grenade) සාම්පල රජයේ රස පරීක්ෂක වෙත යොමුකර එහි සංඝටක සම්බන්ධ වාර්තාවක් ලබා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් විමසීම් කර 2022.02.03 දින අධ්‍යක්ෂ/ සැපයුම් විසින් රජයේ රස පරීක්ෂක වෙත ලිපියක් යොමුකර ඇත. ඊට පිළිතුරු ලෙස කඳුළු වායු උණ්ඩ හා කඳුළු වායු බෝම්බවල රසායනික සංයුතිය පරීක්ෂා කිරීමට රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට හැකියාවක් නොමැති බව 2023.02.17 දින දැනුම් දී ඇත.

16. ශීර්ෂගත මිලදී ගැනීමට අදාලව සිදුකරන ලද සියළු කරුණු ඇතුලත් ප්‍රසම්පාදන ගොනුව 2023.02.09 වන දින දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කල අතර, එහිදී පහත සඳහන් තීරණයන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

i) 2022 වර්ෂයේ ප්‍රතිපාදන වලින් ගෙවීම් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇති බැවින් 2023 වර්ෂයට ප්‍රමානවත් ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම.

ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අතිරේක 29 අනුව ටෙලිග්‍රැෆික් ට්‍රාන්ස්ෆර් (Telegraphic Transfer) ක්‍රමවේද වලින් ගෙවීම් කිරීමට නොහැකි බැවින් ණයවර ලිපි (LC) විවෘත කර 30% ක අත්තිකාරම් මුදලක් ලබාදිය හැකි අතර ඒ සඳහා සුරක්ෂණයක් ලබා ගත යුතුය. ඉතිරි 70% ක මුදල භාණ්ඩ ලැබීමට පෙර ගෙවීම් කල නොහැක.

iii) පෙර මිලදී ගැනීම් වලදී සඳහන්ව නොතිබූ ඉල්ලීම් මෙම ප්‍රසම්පාදනයේදී වරින් වර ඉදිරිපත් කර ඇති අතර, අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුකූලව සහ තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතියට යටත්ව මිලදී ගැනීම සිදුකල යුතුය.

17. ප්‍රසම්පාදන කමිටුව විසින් ලබා දී ඇති ඉහත තීරණයන් ක්‍රියාත්මක කිරීමට අදාලව ගොනුවේ ඉදිරි කටයුතු සිදුකිරීමේදී පහත පරිදි කටයුතු කිරීම සුදුසු බවට තීරණය කර ඇත.

I. ACE International ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ගෙවීම් කොන්දේසි අනුව භාණ්ඩවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට පෙර Telegraphic Transfer (TT) ක්‍රමවේදය යටතේ සම්පූර්ණ මුදලම ආයතනය වෙත ගෙවා අවසන් වන බැවින් සපයනු ලබන භාණ්ඩ නිසි ප්‍රමිතියකින් යුක්ත නොවුනහොත් සිදුවන අලාභය ආවරණය කර ගැනීමේ අවධානම වලක්වා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග සම්බන්ධව ACE International ආයතනය සමඟ සාකච්ඡා කර එකගතාවයක් ලබා ගැනීම සඳහා කමිටුවක් පත්කර හා පහත සඳහන් කරුණු කෙරෙහි එම කමිටු අවධානය යොමු කිරීම.

a) 2019 වර්ෂයේ මීට පෙර මිලදී ගන්නා ලද ගොනුවේ භාණ්ඩ මිලදී ගත් ණයවර ලිපි (LC) විවෘත කිරීමේ ක්‍රමවේදය යටතේ භාණ්ඩ සැපයීමට ඇති හැකියාව.

317

285

b) සැපයුම්කරන භාණ්ඩ වටිනාකමෙන් 10% ක කාර්යසාධන සුරක්ෂණයක් හා මුළු වටිනාකමට අදාලව අත්තිකාරම් සුරක්ෂණයක් ලබාදීමට යටත්ව ගෙවීම් කිරීම. එමෙන්ම, භාණ්ඩ ආනයනය කිරීමේදී නෞභාර රක්ෂණයක් ලබාගැනීම.

c) මෙම භාණ්ඩ නැව් ගත කිරීමට නියමිත තුර්කි රාජ්‍යය තුළ මෙම නිෂ්පාදිත කඳුළු වායු උණ්ඩ/කඳුළුවායු බෝම්බ නියමිත පිරිවිතරයට අනුව නිෂ්පාදනය කර ඇති බවට තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබාදිය හැකි පිළිගත් ස්වාධීන ආයතනයක් පවතින්නේ නම් එම ආයතනයක් වෙතින් ශ්‍රී ලංකාව වෙත අපනයනය කිරීමට නියමිත කඳුළු වායු උණ්ඩ/ කඳුළුවායු බෝම්බ තොගය පිරිවිතරයට අනුව පවතින බවට වාර්තාවක් ගෙවීම් කිරීමට පෙර ලබා ගැනීමට ඇති හැකියාව.

II. මෙම මිලදී ගැනීමට 2023 වර්ෂයේ මුදල් ප්‍රතිපාදන යොදා ගතයුතු බැවින් ඒ සඳහා නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

III. ACE International ආයතනයේ ඉල්ලීම පරිදි Telegraphic Transfer ක්‍රමය යටතේ ඇණවුම් පත සමඟ 30% අත්තිකාරම් මුදලක් ගෙවීම් කිරීමටත්, ඉතිරි 70% වටිනාකමට අදාල අයිතමයන් නිෂ්පාදනය කර අවසන් වූ පසු නැව් ගත කිරීමට පෙර ලබාදීමට ඉල්ලුම් කර ඇති බැවින් එය ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව සිදු කල යුතු බැවින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

IV. කඳුළු වායු උණ්ඩ හා කඳුළු වායු බෝම්බ වල රසායනික සංයුතිය පරීක්ෂා කිරීමට නොහැකි බවට ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති හෙයින් සහ මෙම අයිතම පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් එම ආයතනය හැර වෙනත් කිසිදු ආයතනයක් ශ්‍රී ලංකාව තුල නොමැති හෙයින් තාක්ෂණික ඇගයීම් කමිටු නිරීක්ෂණ අනුව මෙම මිලදී ගැනීම සඳහා සැපයුම්කරු විසින් ලබාදෙන නිෂ්පාදන ආයතනය විසින් ඉදිරිපත් කරන සෞඛ්‍ය වාර්තාවක් පදනම් කර ගෙන ඉදිරි කටයුතු සිදු කිරීම.

ඉහත වාර්තාව ඔබතුමාගේ දැන ගැනීම සහ සුදුසු කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

සී.ඩී වික්‍රමරත්න
පොලිස්පති

සී. ඩී. වික්‍රමරත්න
පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

ඩිල් පිටපතින් උපුටා ගත්
සත්‍ය ශ්‍රායා පිටපතයි.
..............................
ස්ථානාධිපති/සැපයුම්